ප්‍රතිපෝෂණ කාර්ය පත්‍රිකා 05

# ක්‍රිස්තියානි ධර්මය




නිපුණතා මට්ටම 1 : 5

අ.පො.ස (සාමාන්‍ය පෙළ) උපකාරක කාර්ය පත්‍රිකා

ආගමික හා සාරධර්ම ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය

ඉසුරුපාය

බත්තරමුල්ල

## ක්‍රිස්තියානි ධර්මය

## ආදර්ශ ප්‍රශ්න පත්‍රය 5

1. ආබ්‍රහම් දේව කැඳවීමට දැක්වූ ප්‍රතිචාරයෙන් පැහැදිලි වන වැදගත් කරුණු දෙකක් සඳහන් කරන්න.

---------------------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------------------

2. ආබ්‍රහම් තුමා දෙවියන් වහන්සේගෙන් ලද පොරොන්දු ලියන්න.

---------------------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------------------

3. දස පනත ප්‍රධාන වශයෙන් ගොඩනැගී ඇති ආකාර දෙක සඳහන් කරන්න.

---------------------------------------------------------------------------------------------------------------

4. ඊශ්‍රායෙල් ජන සමාජයේ ආලේප ලත් තැනැත්තන්ට උදාහරණ සපයන්න.

---------------------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------------------

5. රජකම හා බැඳුණු මෙසියානු සංකල්පයේ විශේෂ ලක්ෂණ ලියන්න.

---------------------------------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------------------------------

6. මෙසියස් වහන්සේ තුළින් ලැබෙන ආලෝකය හඳුන්වන්න.

7. පැරණි ගිවිසුමේ සඳහන් වන බැටළු එඬේරුන් ලෙස වෘත්තයේ යෙදුණු අය තිදෙනකු නම් කරන්න.

8. පැරණි ගිවිසුමට අනුව එඬේරා හා නව ගිවිසුමට අනුව එඬේරා නම් කරන්න.

9. එඬේර චරිත ගුණාංග ලියන්න.

10. එඬේරුන් ලෙස අප ක්‍රියා කළ යුතු ආකාරය සඳහන් කරන්න.

11. බැටළුවන් ලෙස අප ක්‍රියා කළ යුතු ආකාරය සඳහන් කරන්න.

12. ඇදහිල්ල නිසා දුක් විඳි පැරණි ගිවිසුමේ පුද්ගලයින් දෙදෙනෙකු නම් කරන්න.

13. දුක් විඳින සේවකයාණන් සතු ලක්ෂණය හතරක් සඳහන් කරන්න.

14. වර්තමාන සමාජයේ දුක් විඳින සේවකයාණන් ගේ කාර්යභාරය ඉටුකළ පුද්ගලයින් දෙදෙනෙකු නම් කරන්න.

15. ප්‍රේම පාරමිතාව සඳහන් ප්‍රේමය නොමැති නම් අපගේ ජීවිත කුමකට සමාන කරමිද?

16. සදහටම පවතින ශ්‍රේෂ්ඨතම ආඥාව කුමක්ද?

17. ප්‍රේමයේ ලක්ෂණ තුනක් සඳහන් කරන්න.

18. ජේසුස් වහන්සේ ප්‍රේමය සම්බන්ධව වදාළ ශ්‍රේෂ්ඨතම ආඥාවේ ඇති කොටස් දෙක නම් කරන්න.

19. ප්‍රේමයේ පදනම මත ජීවිතය ගොඩනගා ගැනීමේදී අවශ්‍ය ගුණාංග දෙකක් සඳහන් කරන්න.

20. හිස් තැන පුරවන්න.
    සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝය -------------------------- යුක්තිය උදෙසා පීඩා විඳින්නෝ භාග්‍යවන්තයෝය-----------------

21. ෂාලෝම් යන හෙබ්‍රෙව් වචනයේ අර්ථය ලියන්න.

22. සාමය උදෙසා වැය වූ වර්තමාන පුද්ගලයින් දෙදෙනෙකු නම් කරන්න.

23. පල්ලියේ ගොඩනැගිල්ල ජනතාව සඳහාය යන උදාර සංකල්පය කාගේ සංකල්පයක්ද

24. දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යයට සහභාගි වෙමින් සිටියදී තම ජීවිතය අනපේක්ෂිත ලෙස පූජා කළ දේවගැති තුමා නම් කරන්න.

25. වෛරය හා මිත්‍යාවබෝධය පැරදී විය හැක්කේ හුදු ප්‍රේමයෙන් නොව සතුරන්ටද ප්‍රේම කිරීමෙන් හා සමාව දීමෙන් බව ප්‍රකාශ කළේ කවුරුන්ද,

26. ගරු තිස්ස බාලසූරිය පියතුමාගේ සේවාව පිළිබඳ සටහන් කරන්න.

27. කමාවීම පිළිබඳව ජේසුස් වහන්සේ කළ ඉගැන්වීම් ලියන්න.

28. කමා වීමේ වැදගත්කම පෙන්වාදීම සඳහා ජේසුස් වහන්සේ ඉගැන්වූ උපමාව නම් කරන්න.

29. කමා නොවූ දාසයා පිළිබඳ උපමාව තුළින් අපට ලැබෙන ආදර්ශ ලියා දක්වන්න.

30. ජේසුස් වහන්සේ වදාළ සැබෑ මිදි වැල මමය යන උපමාවට අනුව එහි සඳහන්

මිදිවැල
උද්‍යාන පාලකයා
අතු යනු කවුරුන්දැයි නම් කරන්න.

31. ජේසුස් වහන්සේ පවසන පරිදි පළ නොදරන අතු යනු කවුද?

32. ඵල දරන අතු යනු කවුද?

33 කිතුනු සහා එකමුතුව උදෙසා කටයුතු කරන සංවිධාන නම් කරන්න.

-----------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------

34. සදාතන ජීවනය උරුම කර ගැනීම පිණිස අප තුළ ඇති විය යුතු ජීවිත පරිවර්තනය සඳහා අවශ්‍ය කරුණු තුනක් ලියා දක්වන්න.

-----------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------

35. ශුද්ධ කමේ ජීවිතයක් ගත කිරීම තුළින් ඔබ ලබන වරප්‍රසාද ලියන්න.

-----------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------

36. මුල් කිතුනු සභාවේ ආරම්භක දිනය හඳුන්වන නාමය වන්නේ කුමක්ද?

-----------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------

37. පෙන්තකොස්ත දින සිදුවූ විශේෂ සිදුවීම් ලියන්න.

-----------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------

38. පෙන්තකොස්ත දින දේශණය තුළින් ස්වාමීන් වහන්සේ අදහගත් සෙනඟ කොපමණ ද?

-----------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------

39. මුල් කිතුනු සභාවේ නමස්කාරික ජීවිතයේ ලක්ෂණ ලියන්න.

-----------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------

40. මුල් සභාවේ නමස්කාරික ජීවිතය තුළින් ගොඩනැගෙන ආදර්ශවත් කිතුනුවා ක්‍රියා කරන ආකාරය ලියන්න.

-----------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------

41. මුල් සභාවේ සුබ සාදන මෙහෙවර ඉදිරියට ගෙන යාමේදී ඉස්මතු වූයේ ගැටළු සහගත තත්ත්වය කුමක්ද?

-----------------------------------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------------------------------

42. මුල් සභාවට එල්ල වූ චෝදනාවට ඔවුන් ගත් විසඳුමක් කුමක්ද?

43. උපස්ථායකයන් පත් කිරීමේ දී සලකා බැලූ කරුණු සටහන් කරන්න.

44. උපස්ථායකයින් සත්දෙනා නම් කරන්න.

45. සුභ සාධන සේවයේ ගැටලුවලට මුහුණ දීමේ දී එම අභියෝග ජයගත් මුල් සභාවේ ක්‍රියාදාමය තුළින් මතු වූ වටිනාකම් ලියා දක්වන්න.

**ප්‍රශ්න පත්‍ර 5**

**පිළිතුරු පත්‍රය**

1. ඊශ්‍රායෙල් සමාජය එකම දෙවියන් වහන්සේ අදහන හා එම ඇදහිල්ල මත ගොඩ නැගුණු සමාජයක් බව
   සමාජයේ ආරම්භක ඉතිහාසය ආබ්‍රහම් තුමාගේ කැඳවීම සමග බද්ධව පවතින බව
2. විශාල ජාතික පියා බවට පත්වීම
   දේශයක උරුමය ලැබීම
   අන්‍යයන්ට ආශිර්වාදයක් වීම
3. මිනිසා හා දෙවියන් වහන්සේ අතර සම්බන්ධතාවය
   මිනිසා හා මිනිසා අතර සම්බන්ධතාවය
4. පූජකයන් ආරොන් සහ ඔහුගේ පුත්‍රයන්
   දිවැසිවරුන් එලීෂා දිවැසිවරයා
   රජවරුන් නිම්ෂිගේ පුත් ජෙහූ
5. දාවිත් රජ පරපුරෙන් පැමිණෙන මෙසියස් වහන්සේ පිළිබඳ ඉඟිය
   මෙසියස් වහන්සේගේ රාජ්‍යය සදාකාලික බව
   සාධාරණත්වය යුක්තිය පැවතීම
   බරක් වූ විය දණ්ඩ කඩා දමා විමුක්තිය උදා කිරීම
   අසිරිමත් උපදේශකයාණෝ
   සාමයේ කුමාරයාණෝ
6. පරිපූර්ණ ජීවනය

සාමය හා සංහිඳියාව

පාපයෙන් නිදහස

රෝගවලින් නිදහස

දේව රාජ්‍යයේ වටිනාකම්

දේශපාලන ආර්ථික පීඩනයෙන් නිදහස

7. ආබෙල් ජාකොබ් හා ඔහුගේ දරුවන් දාවිත්

8. දෙවියන් වහන්සේ හා ජේසුස් වහන්සේ

9. පෝෂණය

මගපෙන්වීම රැකබලා ගැනීම හා සොයා ගෙන ඒම

ආරක්ෂා කිරීම හා ජීවිතය කැප කිරීම

හඳුනාගැනීම

10. එඬේර ප්‍රේමය

කැපවීම හා වැයවීම

සේවකත්වය

11. එඬේරාගේ හඬට ප්‍රතිචාර දැක්වීම

එඬේරාගේ හඬට පිටුපෑමෙන් සිදුවන අන්තරාය හඳුනාගැනීම

විශ්වාසවන්ත බැටළු එඬේරාණන්ට කීකරු වීම

12. ජෝබ් සහ ජෙරමියා

13. දෙවියන් වහන්සේගේ ආත්මානුභාවය ලබා සිටි

සැර පරුෂ ගති ලක්ෂණ වෙනුවට මුරුදු ලීලාවෙන් සැරසී සිටි

දුක්පීඩාවට ලක්වූවන් තවත් පීඩාවට ලක් නොකරයි

දුක හා වද වේදනා දරයි

මරණය අපගේ පව් කමා කෙරෙන පූජාවීමේ මරණයකි

14. නෙල්සන් මැන්ඩෙලා

මයිකල් රොද්‍රිගු පියතුමා

15. ඝෝෂා කරන සාංඨාරයකට හෝ කටුක රාවය දෙන කෛයිතාලමකට හෝ සමාන වන හිස් තැනැත්තෙක් වෙමි

16. ප්‍රේමයයි

17. ඉවසිලිවන්තය

කරුණාවන්තය

ඊර්ෂ්‍යාවන්නේ නැත

පාරට්ටු කර ගන්නේ නැත

උඩඟු වන්නේ නැත

අවිනීත නොවේ

ආත්මාර්ථකාමී නොවේ

18. ඔබගේ මුළු ජීවිතයම දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම

තමාට මෙන්ම තම අසල්වැසියාට ප්‍රේම කිරීම

19. යාච්ඤාව ඇදහිල්ල

20. ඔවුහු දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ යැයි කියනු ලබන්නෝය

ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේය

21. සම්පූර්ණ සාමය

22. චන්ද්‍රා ප්‍රනාන්දු පියතුමා

ගරු තිස්ස බාලසූරිය පියතුමා

23. ගරු චන්ද්‍රා ප්‍රනාන්දු පියතුමාගේ

24. ගරු චන්ද්‍රා ප්‍රනාන්දු පියතුමා

25. ගරු තිස්ස බාලසූරිය පියතුමා

26. මූලික මිනිස් අවශ්‍යතාවයන් වන නිවාස ප්‍රශ්නය විසඳීම

ආර්ථික සංවර්ධනය තුළ රැකියා සැපයීම

වැඩසටහන් දියත් කිරීම

සමාජ සාධාරණත්වය නව මං විවෘත කිරීමට දායකවීම

27. ස්වාමීන්ගේ යාච්ඤාව තුළ කමාව පිළිබඳ ඉගැන්වීම

කුරුසි පූජාවේ දී තමන්ට කළ වරදට කමාව දීම තුළින් ප්‍රත්‍යක්ෂ කිරීම

පේදුරු ඇසූ ප්‍රශ්නයට සීමාවකින් තොරව කමා වීමේ ඇති වැදගත්කම පෙන්වා දීම

28. කමා නොවූ දාසයා පිළිබඳ උපමාව

29 කමාව දීමට අප ක්‍රියා කළ යුතු බව

කමාව දීම දේව ගුණාංගයක් බව

කමාව ඉල්ලීම නිවට කමක් නොවන බව

කමාව අප කාටත් අවශ්‍ය බව

කමාව දීමට හා කමාව ලැබීමට නැඹුරු වන අප දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටු කරන බව

කමාව දීම හා ලැබීම තුළින් ජීවිතය අලුත් වීමකට පත්වන බව

30. මිදිවැල - ජේසුස් වහන්සේ

අතු - කිතුනුවන්

උද්‍යාන පාලකයා - දෙවියන් වහන්සේ

31. ජේසුස් වහන්සේට බද්ධව සිටියත් දේව ගුණාංග ලෝකයට නොදීමට කටයුතු කරන අයයි

32. දේව රාජ්‍යයේ පැවැත්මට ප්‍රයෝජනවත් ලෙස දිවි ගෙවන අයයි

33. ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය

ලංකාදේව ධර්ම ශාස්ත්‍රාලය

ශ්‍රී ලංකා බයිබල් සමාගම

තරුණ ක්‍රිස්තියානි සංගමය

තරුණ කාන්තා ක්‍රිස්තියානි සංගමය

ක්‍රිස්තියානි කම්කරු සහෝදරත්වය

34. ධර්මිෂ්ඨකම

ශුද්ධකම

උතුම් ප්‍රීතිය

35. පාපයට වහල් නොවී කීකරු දරුවන් මෙන් හැසිරීම

හැසිරීමෙන් ශුද්ධව සිටීම

දේව ගරුබියෙන් ගත කිරීම

ක්‍රිස්තුස් වහන්සේගේ දිවි පිදීම තුළින් තම කම නැසීම

නිෂ්ඵල ජීවිත මාර්ගවලින් මිදීම

ක්‍රිස්තුස් වහන්සේ මරණින් උත්ථාන කොට මහිමයට පත් කළ දෙවියන් වහන්සේ ඇදහීම

37. සැඩ සුළඟක් හමන්නාක් වැනි හඬක් අහසින් නික්මීම

ගිනි දළු වැනි දිව් බෙදී ගොස් එකිනෙකා මත පිහිටවීම

සැවොම ශුද්ධාත්ම බලයෙන් පූර්ණව අන්‍ය භාෂාවලින් කතා කිරීම

38. තුන් දහසක් පමණ සෙනඟ බෞතිස්මය ලබා සභාවට එකතු විය

39. දිනපතා නොකඩවා එක් සිත්ව දේවමාලිගාවේ රැස්වීම

ගෙයින් ගෙට ගොස් රොටි කැඩීම

සහභාගිකම පැවැත්වීම

යාච්ඤාවේ නිරතව කල්ගත කිරීම

ප්‍රේරිතවරුන්ගේ ඉගැන්වීමෙහි පැවතීම

දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීම

දේව බියෙන් හා ගෞරවයෙන් කල්ගත කිරීම

40. දේව නමස්කාරයට ක්‍රියාශීලීව සහභාගි වීම ගෞරවාන්විතව ශුද්ධ සහභාගිකමට එක්වීම

යාච්ඤාව තුළ සවිමත් ජීවිත ගත කිරීම

දේව වචනය තුළ පිහිටා ඒ අනුව ජීවිතය හැඩගස්වා ගැනීම

41. දිනපතා සහනාධාර දීමේ දී ග්‍රීක් වැන්දඹුවන් නොසලකා හැරීම පිළිබඳව ඉදිරිපත් වූ පැමිණිල්ල

42. අපොස්තුළුවරුන් විසින් අනෙකුත් ගෝල සමූහ සමඟ සාකච්ඡා කිරීම

දෙව් දහම දේශනා කිරීම අතපසු නොකොට සහනාධාර බෙදීමේ කටයුතුවල නිරතවීමේ තත්ත්වය පිළිබඳව තොරතුරු ගොනු කිරීම

උපස්ථායකයන් කණ්ඩායමක් පත් කිරීම

43. යහපත් යැයි පිළිගත් ශුද්ධාත්මයෙන් හා ප්‍රඥාවෙන් පූර්ණ වීම

44. ස්තේපන්

පිලිප්

ප්‍රොකොරස්

නිකනෝර්

තීමොන්

පර්මේනස්

නිකොලොස්

45. ගැටලු ඇතිවීමේදී ඒ සඳහා විසඳුම් සෙවීමට ක්ෂණිකව ක්‍රියාත්මක වීම

සමානාත්මතාව උසස් කොට සැලකීම

ශුද්ධාත්ම බලය තුළ නිවැරදි තීරණ ගැනීම

සාකච්ඡාවෙන් විසඳුම් සෙවීම

දේව වචනය දේශනා කිරීමට මූලිකත්වය දීම

යාච්ඤාවෙන් දේව මඟපෙන්වීම ලබාගැනීම

දෙවියන් වහන්සේ ලබා දී ඇති විවිධ හැකියාවන් සභාවේ අභිවෘද්ධිය සඳහා යෙදවීම